http://mmde.gov.lk/web/images/pdf/2019/final%20e%20news%20palae-%20web%202019.08.30.pdf

# පුරාජෛවවිවිධත්වය

## ඊ පුවත් හසුන 2019 ජූලි

### කලාපය

**ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළ තීරයේ මුතු කර්මාන්තය පිළිබඳ විපරමක්**


මහාචාර්ය ජිනදාස කටුපොත
භූගෝල විද්‍යා අධ්‍යනාංශය, ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය, ශ්‍රී ලංකාව
katupotha@gmail.com


ශ්‍රී ලංකාවේ වඩාත්ම වටිනා ජලජීවී සම්පතක් වූ මුතු බෙල්ලන් කර්මාන්තය වසර 3000ක පමණ පෙර සිටම පවත්වා ගෙන ආවකි. ඒ අනුව ලෝකයේ ස්වාභාවික මුතු බෙල්ලන්ගෙන් ගහණව පැවැතුන භූගෝලීය කලාපයක් වශයෙන් මන්නාරම් බොක්ක ප්‍රදේශය භාවිතයට (exploitation) ගෙන මුතු කර්මාන්තය කරගෙන විත් ඇත (ඡායා රූප: 1- 6).

මිලියන ගණනක් වූ මුතු නිපදවන බෙල්ලන් (Pearl molluscs) ගෙන් *Pinctada radiata* සහ *Pinctada fucata* යන විශේෂ මන්නාරම් වෙරළ තීරයේ සහ ඒ ආශ්‍රිත නොගැඹුරු තැන් වල පිහිටි පාෂාණ හා කොරල්පර ස්ථාන වල සිටි බවට ඓතිහාසික, පුරාවිද්‍යාත්මක හා ජීව විද්‍යාත්මක සාක්ෂි ඇත. ශ්‍රී ලංකාව ඉන්දියන් සාගරයේ මුතු ඇටය ලෙස හැඳින්වූ නිසාම මුතු සම්පත අතින් ලංකාව අතිවිශිෂ්ට දිවයිනකි. එසේම ජෛවවිවිධත්වයකින් ද, මැණික් ගල්වලින් ද විවිධ භූදර්ශන සහ විශිෂ්ට ඉතිහාසයකින් හා සංස්කෘතියකින් ද පොහොසත් වූ රටකි.






**ඡායාරූපය 1: ඩොරික් බංගලා ප්‍රදේශයේ හා ඡායාරූපය 2: කල්ආරු වෙරළ තීරයේ මුතු ඉවත් කිරීමෙන් පසු ඉවත දැමූ මුතු බෙලිකටු කැබලි (2015, සැප්තැම්බර් 15 හා 2018 ජූනි 16 දිනැති ඡායාරූප, මන්නාරම් පාර, වයඹදිග වෙරළ තීරය).**

දකුණු ඉන්දියාවේ සහ ශ්‍රී ලංකාවේ මුතු බෙල්ලන් බහුල මුහුදු පත්ල ලෝකය පුරා ඇති මුතු ප්‍රභව ප්‍රදේශ අතරින් එකකි. එය චීනයේ හයිනන් (Hainan)හි මුතු ප්‍රභව පරිමාණයටම සමාන විය. මන්නාරම් බොක්කෙන් ලබාගෙන විකුණූ මුතු (ඇට) වලට ලොව ඉහළම ස්ථානය හිමි වූ අතර යුරෝපාකරයෙන් ඉහළම මිලක් ලැබී ඇත.

මුතු කිමිදෙන්නන් පෘතුගීසි, ලන්දේසීන් හා බ්‍රිතාන්‍ය යටත් විජිත පාලන සමයන් තුළ ද දිගටම පැවතුනි. බ්‍රිතාන්‍යයන් මුතු කර්මාන්තය මගින් සැළකිය යුතු ආදායමක් උපයනු ලැබූ අතර 1828 මාර්තු සිට මැයි 1837 දක්වා කාලය තුළ පමණක් ස්ටර්ලිං පවුම් 227,131 ක් මුතු කිමිදීම තුළින් ලංකා භාණ්ඩාගාරයට ආදායම ලෙස උපයා දී ඇත. මුතු ඇට කර්මාන්තය අද වන විට අභාවයට ගොස් ඇත.

ඓතිහාසික හා පුරාණප්‍රවාදයන්ට අනුව, සුන්දරත්වයේ රැජින වූ අල්ලිරානි (Allirani) කුමරිය විසින් කුදිරමලය (Kudremalai) අවට පාලනය කරනු ලැබීය. ඇය මුතු වලට විශේෂ උනන්දුවක් දැක්වූ නිසා අරාබි වෙළඳුන් ට මුතු ලබා දී ඒ වෙනුවටල ඇය අශ්වයන් ලබා ගත්තාය. යක්ෂ ගෝත්‍රික කාන්තාවක් වූ අල්ලිරාණි, මුතු කර්මන්තය නිසා වන්කාලෙයි ප්‍රදේශය දක්වා ඇගේ අණසක පැතිරවූවාය.

පෘතුගීසි, ලන්දේසි හා බ්‍රිතාන්‍යය යුගයේ ශ්‍රී ලංකාවේ වයඹදිග වෙරළබඩ තීරය මුතු ධීවර කර්මාන්තය සඳහා වඩාත්ම ප්‍රසිද්ධ වූ අතර පෘතුගීසි කාල පරිච්ඡේදය තුළ, මන්නාරමේ මුතු ධීවර කර්මාන්තයේ යෙදී සිටි මුතු ධීවරයන්, වෙළෙන්දන් ඇතුළු අනිකුත් පුද්ගලයන් සංඛ්‍යාව 50,000 සිට 60,000ක් දක්වා සිටියහ. ලන්දේසීන් හා බ්‍රිතාන්‍යය යුගයේ පවා, මෙම කර්මාන්තයේ සැළකිය යුතු තරම් ශ්‍රම බලකායන් සිටි අතර, බොහෝ විට දෙමළ, මරක්කල සහ අරාබිවරුන් ඒ අතර වූහ. විසිවන ශතවර්ෂයේ ආරම්භයේ දී, මුතු කර්මාන්තය හේතු ගණනාවක් නිසා, උදා, මැදපෙරදිග කලාපයේ කාර්මික මට්ටමේ තෙල් ගවේෂණය හා නිස්සාරණය කිරීම, ප්‍රමාණය ඉක්මවා මුතු බෙල්ලන් එකතු කිරීම සහ බෙල්ලන් ජීවත්වන මුහුදු පත්ලෙහි රොන්මඩ තැන්පත්වීම, වෙනත් මසුන් ගේ ගොදුරු බවට පත්වීම සහ රෝග වලට ගොදුරුවීම ආදිය ඒ අතර විය. වර්ෂ 1850 පමණ සිට ගෝලීය දේශගුණික විපර්යාස නිසා ඇතිවූ බලපෑම් ද දැනට පවත්නා මෝසම් සුළං රටාවේ වෙනස්කම් පවා බලපාන ලද අතර, ElNino හා LaNina ක්‍රියාදාමයන්හි වෙනස්කම්ද මුතු කර්මාන්තයේ කඩා වැටීමට හේතු විණි.






**ඡායාරූපය 3: මුතු ඉවත් කිරීමෙන් පසු ඉවත දැමූ කල්ආරු වෙරළ තීරයේ මුතු බෙලිකටු කැබලි (2015, සැප්තැම්බර් 15 හා 2018 ජූනි 16 දිනැති ඡායාරූපයක්) හා ඡායාරූපය 4: Genus Pinctada.**





**රූපය 5: මුතු ධිවරයන් කිමිදීමට සූදානම්වන අයුරු, 1906 සහ රූපය 6: 1920-1930 ශ්‍රී ලංකාවේ මුතු ධීවර කර්මාන්තයේ යෙදුන කම්කරුවන් (*Source:* Woolf in Ceylon. Christopher Ondaatje).**

***විමසීම් -***
***ජෛවවිවිධත්ව අංශය***
***මහවැලි සංවර්ධන හා පරිසර අමාතයාංශය සොබාදම් පියස,***
***නො 416/ C /1 රොබට්ගුණවර්ධන මාවත බත්තරමුල්ලල,***
***දුරකතන - 0112034208***